ආයුර්වේද වෛද්‍ය සභාව 2010

-----------------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>විගණන මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පැවති තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.2.1 **<u>ගණකාධිකරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වෙන් කිරීම රු.114,019 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.7,146 ක පරිගණක ජාල ගත කිරීමේ වියදම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ) රු.64,674 ක් වූ පෙර වර්ෂ ගැලපුම් මූල්‍ය ප්‍රකාශනවල වෙනම නොපෙන්වා සංචිත ගිණුමට ගලපා තිබුණි.

1.2.2 **<u>නීතී,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
| --- | --- |
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 වන කොටසේ 2(1) වගන්තිය | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතුරින් තෝරාපත් කරගනු ලැබූ සාමාජිකයින් 3 දෙනෙකු සභාවේ සංයුතියට ඇතුලත්වී නොතිබුණි. |

(ආ) රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මු.රෙ.756(1) හා<br>මු.රෙ.757(2)(ආ) | සමාලෝචිත වර්ෂයේ ආයතනයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි.<br>2009 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතා හා නැතිවීම් ලෙස හඳුනාගත් විවිධ භාණ්ඩ ඒකක 38 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතඵලය රු.982,615 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපව ඉකුත් වර්ෂය සඳහා රු.1,315,473 ක ඌනතාවයක් වූයෙන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,298,088 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. රජයෙන් ලැබුණු ප්‍රතිපාදන වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

2.2 <u>කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයේදී ආයුර්වේද වෛද්‍ය සභාවට වෛද්‍යවරු 475 බැගින් ලියාපදිංචි කර තිබූ අතර 2010 දෙසැම්බර් 31 දිනට මුළු ලියාපදිංචි වෛද්‍යවරු සංඛ්‍යාව 20,004 ක් විය.

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාවේ කටයුතු පහසු කිරීම සඳහා අනුකමිටු පිහිටුවා ඒවා මඟින් ඉටු කළයුතු කාර්යයන් වෙන්කර දක්වා තිබූ නමුත් 2008,2009 හා 2010 වන විටද පවරන ලද බොහෝ කටයුතු ඉටුකර නොතිබුණි.

උදාහරණ:-

(i) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අත්පොත් සැකසීම

(ii) දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තීය සංවර්ධන වැඩසටහන

(iii) දේශීය පාරම්පරික දැනුමට අදාල දත්ත මූලාශ්‍රය පිහිටුවීමේ කමිටුව

(ඇ) 2010 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මඟින් දක්වා තිබූ සමහර වැදගත් කර්තව්‍යයන් ඉටුකර නොතිබූ නිසා ක්‍රියාකාරී සැලැස්ම ඵලදායි මෙහෙයුම් උපකරණයක් ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. උදාහරණ

(i) ආයුර්වේද වෛද්‍ය සභාවෙන් නෛතික රාමුව බලගැන්වීම හා ආයුර්වේද පනතෙන් නිතිමය නියෝග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

(ii) වෘත්තිමය අධිකාරි බලය පිරිනැමීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම.

(iii) ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වාගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතින් ක්‍රියාත්මක කිරීම.

2.3 <u>අනාර්ථික ගනුදෙනු</u>

(අ) පාරිතෝෂික සඳහා වාර්ෂිකව කරනු ලබන වෙන්කිරීම ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමක පවත්වාගෙන යන අතර අදාල අනුමැතින් ලබාගෙන ස්ථිර තැන්පතුවක ආයෝජනය කළේ නම් වැඩි ආයෝජන පොලියක් උපයාගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන ශේෂය රු.1,034,608 ක් විය.

(ආ) සභාවේ සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම්ගත කර තිබූ කාර්යයන් ඉටු නොකිරීම නිසා රජයේ ප්‍රතිපාදන වශයෙන් ලැබුණු මුදලින් රු.1,900,595 ක් ජංගම ගිණුමේ ඉතිරි වී තිබුණි.

2.4 <u>අභ්‍යන්තර විගණනය</u>

අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතාවයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම
(ආ) වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.
(ඇ) විමර්ශන